පොදු චක්‍රලේඛ 01/2026

මගේ අංකය- DCDSP/02/22/03
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
පෙට්ටිගලවත්ත,
ගාල්ල.
2026.01. 23

ගරු සභාපති/ සාමානාධිකාරී/ කළමණාකරු/ගණකාධිකාරී,
(දකුණු පළාතේ සියළුම සමුපකාර සමිති)

**දකුණු පලාත තුල ලියාපදිංචි සමුපකාර සමිති වලින් සමුපකාර අරමුදලට දායක මුදල් ගෙවීම සම්බන්ධවයි.**

දකුණු පළාත තුල ලියාපදිංචි සියළුම සමුපකාර සමිති සම්බන්ධයෙන් දකුණු පළාතේ පළාත් සභාවේ 2019 අංක 06 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය හා එම ප්‍රඥප්තියේ 58 වෙනි වගන්තිය යටතේ සකස් කරන ලද 2019 දකුණු පළාත් සමුපකාර සමිති රීති අදාල වේ.

02. උක්ත සමුපකාර සමිති ප්‍රඥප්තියේ 60.(1) වගන්තිය අනුව පිහිටුවන ලද සමුපකාර සංවර්ධන අරමුදල සඳහා, දකුණු පළාත තුල ලියාපදිංචි සෑම සමුපකාර සමිතියක් විසින්ම ප්‍රඥප්තියේ 39 වගන්තිය අනුව සිදු කරනු ලබන විගණනයේදී විගණක විසින් නිශ්චය කරනු ලබන පරිදි විසර්ජනයට පෙර ලැබෙන ලාභයෙන් සියයට පහකට නොඅඩු මුදලක් හෝ යම් සමුපකාර සමිතියක් පාඩු ලබන අවස්ථාවක අවම වශයෙන් රුපියල් 50.00 ක මුදලක් ගෙවිය යුතු බව උක්ත ප්‍රඥප්තියේ 37 වගන්තියේ සඳහන් වේ.

03. ඒ අනුව සමිතිය ලාභ ලබන අවස්ථාවකදී විගණක විසින් නිශ්චය කරනු ලබන පරිදි යම් සමුපකාර සමිතියක් විසින් සමුපකාර සංවර්ධන අරමුදල සඳහා ගෙවිය යුතු මුදලේ ප්‍රමාණය සමිතියේ වාර්ෂික ශුද්ධ ලාභයෙන් සියයට පහක් විය යුතු බවද, සමිතිය පාඩු ලබන අවස්ථාවකදී අවම වශයෙන් රුපියල් 50.00 ක මුදලක් සමුපකාර අරමුදල සඳහා ගෙවිය යුතු බවද, සමිතිය ලාභ ලබන අවස්ථාවකදී වුවද සමුපකාර අරමුදලට ගෙවිය යුතු මුදල අවම වශයෙන් රුපියල් 50.00 ක් විය යුතු බවද මෙයින් නියම කරමි.

04. 2025.03.14 දිනෙන් පසුව සිදු කරනු ලබන ප්‍රවර්ථන හෝ කල්පසු යන සියළුම විගණනයන්ට අදාලව ඉහත පරිදි සමුපකාර සංවර්ධන අරමුදලට ගෙවීම් සිදු කල යුතු බවද වැඩිදුරටත් මෙයින් නියම කරමි.

05. තවද, ඉහත පරිදි නිශ්චය කරනු ලබන සම්පූර්ණ මුදල, ඔබ සමිතියට විගණන වාර්තාව ලැබුනු දින සිට දින 90ක් ඇතුළත දිස්ත්‍රික්කය භාර සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් වෙත ගෙවිය යුතු වන අතර, එසේ නොගෙවන අවස්ථාවක උක්ත ප්‍රඥප්තියේ 37.(1) (අ) (i) වගන්තිය අනුව කටයුතු කිරීමට සිදුවේ.

06. උක්ත ප්‍රඥප්තියේ 38.(1) වගන්තිය අනුව සෑම ලියාපදිංචි සමුපකාර සමිතියක්ම සමිතියේ ආදායම් හා වියදම් වත්කම් හා හා බැරකම් සහ වෙනත් සියළු ගනුදෙනු පිළිබඳ නියමිත ප්‍රමිතීන්ට අනුව නිසි ගිණුම් පැනවීම හා පවත්වාගෙන යායුතු බැවින් එම නියමයන් අනුව කටයුතු කිරීම සෑම සමුපකාර සමිතියකම වගකීමක් වේ.

07. තවද මෙම චක්‍ර ලේඛය ක්‍රියාත්මක වීමත් සමඟ මාගේ අංක DCDSP/02/18/04 හා 2023.07.05 දරන පොදු චක්‍රලේඛ 03/2023 චක්‍රලේඛය අවලංගුවේ.

සී. වික්‍රමසිංහ,
සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්,
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
දකුණු පළාත.

සී. වික්‍රමසිංහ
සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් (ද.ප.)
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
දකුණු පළාත

පිටපත්-

| | | |
|---|---|---|
| 01.සහකාර කොමසාරිස්(ගාල්ල/මාතර/හම්බන්තොට) | - | අදාල සියළුම සමුපකාර සමිති දැනුවත් කිරීම සඳහා මෙන්ම විගණන නිලධාරීන්ට අවශ්‍ය උපදෙස් ලබා දීම සඳහා |
| 02.සියළුම සමිති භාර නිලධාරීන් | - | තම බල ප්‍රදේශයේ පවතින සියළුම සමුපකාර සමිති මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීමට |
| 03.සියළුම සමුපකාර සංවර්ධන නිලධාරීන් | - | විගණනයේදී මේ අනුව කටයුතු කිරීම සඳහා |